# පළාත් පාලන දෙපාර්තමේන්තුව - වයඹ පළාත
# உள்ளூராட்சி திணைக்களம் - வடமேல் மாகாணம்
# Department of Local Government - NWP

2වන මහල, බී දොරටුව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

2ஆம் மாடி, பீ நுழை வாயில்,
மாகாண சபை அலுவலக கட்டிடத்தொகுதி,
குருநாகல்.

2nd Floor, B Entrance,
Provincial Office Complex,
Kurunegala.


මගේ අංකය / எனது இலக்கம் / My No } ව/පපාදෙ/01/05/06/01

ඔබේ අංකය / உமது இலக்கம் / Your No }

දිනය / திகதி / Date } 2021. 08. 04

චක්‍රලේඛ අංකය - 2021 / 01

වයඹ පළාතේ සියලු ම ප්‍රාදේශීය සභා ප්‍රධානීන් වෙත,

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය යටතේ, වයඹ පළාතේ ප්‍රාදේශීය සභා සතු පාරවල්වල සහ පටු මාවත්වල අයිතිය ප්‍රකාශයට පත් කිරීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රාදේශීය සභා සතු විය යුතු පාරවල්වල සහ පටු මාවත්වල අයිතිය ප්‍රකාශයට පත් කිරීම සඳහා ගැසට් නිවේදන පළ කිරීමට අදාල නියෝග ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක: 2238 / 35 සහ 2021 ජූලි මස 30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇත. මෙම ගැසට් නිවේදනය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

**2.** මෙම නියෝගවල නියම කර ඇති පරිදි ඔබගේ ප්‍රාදේශීය සභාව සතු වී ඇති සේ සලකනු ලබන පාරවල්වල සහ පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම සහ ඒ පාරවල් සහ පටු මාවත්වල නාම ලේඛනය ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ ගැසට් නිවේදන පළ කිරීමට ඉඩ දී ඇති කාලය, 2022 ජූලි මස 29 වන දිනෙන් අවසන් වේ. මෙම නියෝග මගින් නියම කර ඇති ආකාරයට මෙම කාර්යය සිදු කිරීම සඳහා මෙම චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

**3. පාරවල්වල සහ පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම සහ නාමලේඛනය ප්‍රසිද්ධ කිරීමේ ක්‍රමය.**

**3.1 සැලසුම් පිළියෙළ කිරීම සඳහා මූලික දත්ත රැස් කිරීම.**

3.1.1 ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත්වල භූගෝලීය දත්ත, පාරවල්වල හෝ පටු මාවත්වල සැලසුම් සහ ජාලගත සැලසුම් නිර්මාණය කිරීම සහ ගබඩා කර තැබීම සඳහා වෙනම පරිගණක යන්ත්‍රයක් වෙන් කර දිය යුතු ය.

3.1.2 පාරවල් සහ පටු මාවත් සැලසුම් ගත කිරීම සඳහා "කඳවල/ශ්‍රී ලංකා භූගෝලීය ඛණ්ඩාංක"යොදා ගැනීමට නියෝග මගින් නියම කර ඇත. මේ නිසා අදාළ පාරට හෝ පටු මාවතට ගොස් මෙම භූගෝලීය ඛණ්ඩාංක ලබා ගැනීම කළ යුතු ය. එසේ ලබා ගන්නා දත්ත, මෙහි ඇමුණුම 01 අනුව සටහන් තබා ගත යුතු ය.

3.1.3 භූගෝලීය තොරතුරු පද්ධති (GIS) මෘදුකාංගය යොදා ගනිමින් සකස් කළ යුතු වන පාරේ හෝ පටු මාවතේ සැලසුමෙහි, පාරට හෝ පටු මාවතට අදාළ පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය සභාව, ග්‍රාම නිලධාරි වසමේ අංකය හා නම, ආරම්භක ස්ථානය, වෙනත් පාරක සිට පාර හෝ පටු මාවත විහිදෙන දිශාව (වමට ද, දකුණට ද යන වග) සහ අවසාන වන ස්ථානය දැක්විය යුතු ය. ඊට අතිරේකව වීථි පහන්, මතුපිට තලය සහ වෙනත් ඉදිකිරීම් (පාලම් / බෝක්කු / පැති බැම් හා බදින ලද කාණු) පිළිබඳ තොරතුරු සැලැස්මට ඇතුළත් විය යුතු ය.

3.1.4 සෑම සැලැස්මක් ම A4 ප්‍රමාණයේ කඩදාසියක වර්ණ සහිත ව මුද්‍රණය කළ යුතු ය.




කාර්යාලය / அலுவலகம் / Office } Tel : 037 2222171, Fax : 037 2228018, Web : www.dolgnwp.lk, E-mail : dolgnwp@yahoo.com

කොමසාරිස් / ஆணையாளர் / Commissioner } 037 2228039

සහකාර කොමසාරිස් / உதவி ஆணையாளர் / Assit. Commissioner } 037 2227120

3.1.5 ප්‍රාදේශීය සභාවේ පරිපාලන කාර්ය හා තීරණ ගැනීමේ කාර්යය පහසු කරවීම පිණිස බල ප්‍රදේශයේ පාරවල් සහ පටු මාවත් සියල්ල ඇතුළත් වන පරිදි පාරවල් සහ පටු මාවත් ජාලය, වීථි පහන් ජාලය, පාරේ හෝ පටු මාවතේ මතුපිට සංවර්ධිත තලය සහ වෙනත් ඉදිකිරීම් (පාලම් / බෝක්කු / පැති බැම් හා බඳින ලද කාණු) ඇතුළත් වන පරිදි ජාලගත සැලසුම් නිර්මාණය කළ යුතු ය. මේ කාර්යය සඳහා වන දත්ත සටහන් කිරීම සඳහා භාවිත කළ යුතු ඒකාබද්ධ වගු (Attribute Table) මෙහි ඇමුණුම 02 හි ආකෘතියට සාරානුකූලව පිළියෙළ කළ යුතු ය.

3.1.6 ඉදිරියේ දී කිසියම් පාරක හෝ පටු මාවතක සිදු කරනු ලබන සංවර්ධනය කිරීම් (මතුපිට තලය, පුළුල් කිරීම, බෝක්කු හෝ පාලම්, පැති කාණු හෝ පැති බැම් සංවර්ධනය කිරීම) කරනු ලැබූ පසු ඊට අදාළ ගෙවීම් කිරීමට පෙර ඒ පාරෙහි හෝ පටු මාවතෙහි සැලැස්ම සහ ජාලගත සැලැස්ම යාවත්කාලීන කළ යුතු ය. කිසියම් පාරක හෝ පටු මාවතක සැලැස්මක් හෝ ජාලගත සැලැස්මක් යාවත්කාලීන කිරීමේ දී, කලින් පිළියෙළ කරන ලද සැලැස්මට අදාළ පරිගණක මෘදු පිටපත වෙනම ගබඩා කර තැබීම සඳහා වැඩ පිළිවෙළ ඇති කිරීමට ක්‍රියා කල යුතු ය.

3.1.7 5 (1) නියෝගය සමග කියවිය යුතු එම නියෝගවල පළමුවන උපලේඛනයේ දැක්වෙන නියම අනුව ප්‍රාදේශීය සභාව සතු එක් එක් පාර හෝ පටු මාවත හඳුනා ගැනීමේ කේත අංකයක් බැගින් වෙන් කළ යුතු ය. මෙම කේත අංකයට ඇතුළත් විය යුතු වයඹ පළාතේ එක් එක් ප්‍රාදේශීය සභාව වෙනුවෙන් වෙන් කර දෙනු ලබන කේත ලකුණ මෙහි ඇමුණුම 03 හි ද, පාරේ හෝ පටු මාවතේ සංවර්ධිත තලය හඳුනා ගැනීම සඳහා වෙන් කළ වර්ණය ඇමුණුම 04 හි ද දැක්වෙන ආකාරයෙන් යොදා ගත යුතු ය.

**3.2 ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත්වල ලේඛනය සඳහා සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලබා ගැනීම.**

3.2.1 නියෝගවල 4 (1) නියෝගය අනුව, කිසියම් ප්‍රාදේශීය සභාවක් සතු පාරවල් සහ පටු මාවත් නියෝගවල තුන් වන උපලේඛනයෙහි ආකෘතියට සාරානුකූලව පිළියෙළ කර ගත් ලේඛනයක් ප්‍රාදේශීය සභාව අයත් වන දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර එකඟතාව ලබා ගත යුතු ය.

3.2.2 ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සැලකීම සඳහා සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලැබී ඇති පාරවල් සහ පටු මාවත් සම්බන්ධයෙන් මෙහි පහත 3.4 ඡේදයේ සඳහන් ආකාරයෙන් ක්‍රියා කළ යුතු ය.

**3.3 ලිපි ගොනු නඩත්තුව.**

3.3.1 මෙම ක්‍රියාවලිය සඳහා පොදු ස්ථාවර ගොනුවක් පවත්වා ගත යුතු ය. එම ගොනුව කවර හෝ හේතුවක් මත අපහරණය කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතු අතර එම ගොනුවෙහි පහත කරුණු ඇතුළත් විය යුතු ය.

i. 4 (1) නියෝගය ප්‍රකාර සහකාර කොමසාරිස්වරයා විසින් එකඟතාව ප්‍රකාශයට පත් කළ ලිපියේ පිටපතක්;

ii. අදාළ පාර හෝ පටු මාවත ඇතුළත් කරමින් 9 (1) නියෝගය අනුව ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු ලැබූ යෝජනාවේ උධෘතයක්;

iii. අදාළ පාර හෝ පටු මාවත ඇතුළත් කරමින් 9 (2) නියෝගය අනුව ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනයේ පිටපතක්;

iv. අදාළ පාර හෝ පටු මාවත ඇතුළත් කරමින් 12 (1) නියෝගය අනුව ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු ලැබූ යෝජනාවේ උධෘතයක්; සහ

v. අදාළ පාර හෝ පටු මාවත ඇතුළත් කරමින්, අවස්ථාවෝචිත පරිදි 12 (2) හෝ 12 (3) නියෝගය අනුව ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනයේ පිටපතක්.

3.3.2 ප්‍රාදේශීය සභාව සතු සෑම පාරක් ම සහ පටු මාවතක් ම වෙනුවෙන්, ඉලෙක්ට්‍රොනික ලිපි ගොනුවක් බැගින් සහ කඩදාසි ලිපි ගොනුවක් (දෘඩ ලිපි ගොනුවක්) බැගින් පවත්වාගෙන යාමට ක්‍රියා කළ යුතු ය. මේ එක් එක් ලිපි ගොනුවට පහත සඳහන් තොරතුරු ඇතුළත් වී තිබිය යුතු ය.

(අ) පාරට හෝ පටු මාවතට අදාළ භූගෝලීය දත්ත ඇතුළත් කළ ඇමුණුම 01 හි පිටපත;

(ආ) 7 වන නියෝගය අනුව පිළියෙල කළ සැලැස්ම.


(ඇ) පාරක් හෝ පටු මාවතක් සම්බන්ධයෙන් කරනු ලබන යම් සංවර්ධන කාර්යයක් හෝ වෙනස් කිරීමක් වේ නම්, එම සංවර්ධනය හෝ වෙනස් කිරීම කවර ආකාරයේ එකක් ද යන වග සහ ඒ පිළිබඳ ව දරනු ලැබූ වියදම් පිළිබඳ විස්තරයක්

3.3.3 කවර හෝ හේතුවක් මත මෙසේ නිර්මාණය කරනු ලබන ඉලෙක්ට්‍රොනික ලිපි ගොනුව හා දෘඩ ලිපි ගොනුව, එකී පාර හෝ පටු මාවත සම්බන්ධයෙන් කෙරෙන සංවර්ධනයක් සඳහා වන ටෙන්ඩර් කැඳවීම් හෝ ඊට අදාළ ගෙවීම් හෝ වෙනත් එවැනි ආකාරයේ ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගැනීමෙන් වැළකී සිටීමට වග බලා ගැනීමත්, එවැනි කටයුතු සඳහා වෙනම ලිපි ගොනුවක් යොදා ගැනීමටත් ක්‍රියා කිරීම දැඩිව අවධාරණය කරනු ලැබේ.

3.3.4 මෙසේ භාවිත කරනු ලබන ඉලෙක්ට්‍රොනික ලිපි ගොනුවේ සහ දෘඩ ලිපි ගොනුවේ අංකය විය යුත්තේ, නියෝගවල පළමුවන උපලේඛනය හා ඉහත 3.1.7 ඡේදයෙහි දක්වා ඇති ආකාරයෙන් අදාළ පාරට හෝ පටු මාවතට වෙන් කරනු ලැබූ අංකය වේ. එසේම ඉලෙක්ට්‍රොනික ලිපි ගොනුව සඳහා වෙන් කරනු ලබන අංකයෙන් නම් කිරීමේ දී එය පරිගණක File Folder එකක් විය යුතු ය. මෙම සියලු ම ඉලෙක්ට්‍රොනික ලිපි ගොනු "PS Road and Lanes" යනුවෙන් නම් කළ ප්‍රධාන File Folder එකක් සකස් කර එම File Folder එක තුළට ඇතුළත් කර තිබිය යුතු ය.

(මෙය අවබෝධ කර ගැනීම සඳහා පහත උදාහරණය අධ්‍යයනය කරන්න)

උදාහරණ:




### 3.4 ප්‍රාදේශීය සභාව සතු විය පාරවල් සහ පටු මාවත් ප්‍රකාශයට පත් කිරීම.

3.4.1 පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ එකඟතාව ලැබී ඇති පාරවල් සහ පටු මාවත්වල නාමලේඛනයක්, නියෝගවල 8 වන නියෝගය සමඟ කියවිය යුතු එකී නියෝගවල තුන් වන උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කර 9 වන නියෝගයෙන් නියම කර ඇති ආකාරයේ සභා

යෝජනාවක් (පළමුවන සභා යෝජනාව) සම්මත කර ගැනීම කළ යුතු ය. මෙම සභා යෝජනාව සඳහා ඇමුණුම 05 හි ආදර්ශය යොදා ගැනීම සුදුසු වේ.

3.4.2 අදාළ සභා යෝජනාව සම්මත කර ගනු ලැබූ වහාම, මෙහි ඇමුණුම 06 හි ආදර්ශයට අනුව පිළියෙළ කළ නිවේදනයක් (පළමුවන ගැසට් නිවේදනය) ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්වීමට ක්‍රියා කළ යුතු ය. මෙම ගැසට් නිවේදනයට ඇතුළත් කළ යුතු උපලේඛනය වශයෙන් නියෝගවල තුන් වන උපලේඛනය යොදා ගත යුතු ය.

3.4.3 ඉහත 3.4.2 ඡේදය අනුව ගැසට් නිවේදනය පළ කළ වහාම 10 වන නියෝගයෙන් නියම කර ඇති ආකාරයට පවත්වා ගත යුතු නඩු ලේඛනය මෙහි ඇමුණුම 07 හි ආදර්ශයට අනුව පිළියෙළ කළ යුතු අතර, එම නිවේදනයේ ඇතුළත් කිසියම් පාරක් හෝ පටු මාවතක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් අධිකරණයේ නඩු පවරා ඇති නම් ඒ පිළිබඳ තොරතුරු එකී නඩු ලේඛනයෙහි සටහන් කර තැබීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතු ය.

3.4.4 3.4.2 ඡේදය යටතේ පළ කළ ගැසට් නිවේදනයේ දින සිට මාස තුනක් ඉක්ම ගිය පසුව සහ මාස හයක් ගත වීමට පෙර කිසියම් පාරක හෝ පටු මාවතක අයිතිය සම්බන්ධයෙන් අධිකරණයේ නඩු පවරා නැති පාරවල් සහ පටු මාවත්, ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා මෙහි ඇමුණුම 08 හි ආදර්ශයට අනුව යෝජනාවක් (දෙවන සභා යෝජනාව) සම්මත කළ යුතු ය.

3.4.5 3.4.4 හි යෝජනාව සම්මත කර ගනු ලැබූ වහාම, මෙහි ඇමුණුම 09 හි ආදර්ශයට අනුව පිළියෙළ කළ නිවේදනයක් (දෙවන ගැසට් නිවේදනය) ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්වීමට ක්‍රියා කළ යුතු ය. මෙම ගැසට් නිවේදනයට ඇතුළත් කළ යුතු උපලේඛනය වශයෙන් නියෝගවල තුන් වන උපලේඛනය ම යොදා ගත යුතු ය.

**3.5 පාරවල්වල සහ පටු මාවත්වල මායිම් සලකුණු කිරීම.**

3.5.1 පාරවල්වල සහ පටු මාවත්වල අයිතිය තහවුරු කිරීමේ දෙවන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව මෙම ඡේදයේ පහත දක්වා ඇති පරිදි, හැකි පහසු ඉක්මණින් එකී පාරවල්වල සහ පටු මාවත්වල මායිම් සලකුණු කිරීමට ප්‍රාදේශීය සභාව ක්‍රියා කළ යුතු ය.

3.5.2 පාර හෝ පටු මාවත -

(අ) ආරම්භ වන ස්ථානයේ;

(ආ) අවසන් වන ස්ථානයේ;

(ඇ) සරල රේඛාවක ස්වභාවයෙන් වෙනස් වන සෑම ස්ථානයක ම; සහ

(ඈ) සාමාන්‍ය පළලට වඩා වෙනස් වන සෑම ස්ථානයක ම,


වම් පස හා දකුණු පස මෙම මායිම් සලකුණු කිරීම කළ යුතු ය.

3.5.3 උස සෙන්ටි මීටර් 75 ක් ද, පළල සෙන්ටි මීටර් 18 ක් ද හා ඝනකම සෙන්ටි මීටර් 15 ක් ද වන සේ ද, සිරස්ව මිලි මීටර් 6 මෘදු වානේ කම්බි 4 ක් ද , තිරස්ව මිලි මීටර් 6 මෘදු වානේ කම්බි සෙන්ටි මීටර් 15 පරතරයට සිමෙන්ති, වැලි සහ ¾'' ප්‍රමාණයේ කළු ගල්, පිළිවෙළින් 1 : 2 : 3 අනුපාතයෙන් යුතු වූ කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් සාදා ගනු ලබන මායිම් සලකුණු කිරීමේ කණු සාදා ගත යුතු අතර එම මායිම් කණුවෙහි එක් පළල මුහුණතක, ඇමුණුම 03 න් හඳුන්වා දී ඇති ආකාරයට තම ප්‍රාදේශීය සභාවට වෙන් කර දී ඇති අකුරු සලකුණු ඇතුළට කාවද්දා ඇති පරිදි සටහන් වී තිබිය යුතු ය.

3.5.4 මායිම් කණුව පොළොව තුළට 45 cm බැගින් පිහිටන පරිදි පොළොවෙහි වැළලීම කළ යුතු ය.

3.5.5 සෑම මායිම් කණුවක් ම පිහිටුවනු ලැබූ ස්ථානයේ භූගෝලීය ඛණ්ඩාංක සටහන් කරගෙන, එම දත්ත අදාළ පාරට හෝ පටු මාවතට අදාළ ඉලෙක්ට්‍රොනික ලිපි ගොනුවෙහි සහ දෘඩ ලිපි ගොනුවෙහි ඇතුළත් කර තිබිය යුතු ය.

3.5.5 මායිම් සලකුණු කිරීම සඳහා යොදා ගන්නා කණුවෙහි ආදර්ශ රූප සටහන පහත දක්වා ඇත.




### 3.6 දත්ත හා තොරතුරු සංරක්ෂණය.

3.6.1 ඉහත 3.4.2 ඡේදය අනුව පළමුවන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කළ වහාම, ප්‍රාදේශීය සභාව සතු විය යුතු බවට සලකනු ලබන එක් එක් පාරට සහ පටු මාවතට අදාළ ව 3.3 ඡේදයේ විස්තර කර ඇති ආකාරයට නියම කළ සෑම ඉලෙක්ට්‍රොනික ලේඛන පිටපත් ම, ප්‍රාදේශීය සභාව නමින් වූ File Folder එකකට ඇතුළත් කර පළාත් පාලන කොමසාරිස් වෙත සහ අදාළ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත භාර දීමට ක්‍රියා කළ යුතු ය.

3.6.2 ඉහත ආකාරයෙන් ම වූ ඉලෙක්ට්‍රොනික ලේඛන බාහිර දෘඩ තැටියක (External Hard Disk) ද, වෙනම වූ Server එකක ද ගබඩා කර තැබීමට ද ක්‍රියා කළ යුතු ය.

3.6.3 භූගෝලීය දත්ත ඇතුළත් කර ඇති සහ පාරවල්වල සහ පටු මාවත්වල කාර්යය සඳහා යොදා ගනු ලබන සෑම පරිගණකයක් ම, බලපත්‍ර සහිත ක්‍රියාත්මක කිරීමේ මෘදුකාංග (Genuine Windows Operating System) ස්ථාපිත පරිගණක විය යුතු අතර යාවත්කාලීන වයිරස ආරක්ෂණ මෘදුකාංග සහිත විය යුතු ය.


3.6.4 පළාත් පාලන කොමසාරිස්ගේ හෝ පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ පූර්ව ලිඛිත අනුමතයකින් තොරව පාරවල්වල සහ පටු මාවත්වල ජාලගත සැලසුම් ඇතුළත් ඉලෙක්ට්‍රොනික මෘදු පිටපතක් කවර හෝ බාහිර පාර්ශවයක් වෙත ලබා දීම නොකළ යුතු ය.

### 3.7 ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් සංවර්ධනය කිරීමේ දී අනුගමනය කළ යුතු ආකාරය.

3.7.1 ප්‍රාදේශීය සභාව සතු කිසියම් පාරක් හෝ පටු මාවතක් සංවර්ධනය කිරීමේ දී එකී පාරට වෙන් කළ කේත අංකය සහ නමක් ඇත්නම් එය ද ඊට අදාළ සෑම ලේඛනයක ම සටහන් කිරීමට ක්‍රියා කළ යුතු ය.

3.7.2 තහවුරු කිරීමේ ගැසට් නිවේදනයේ ප්‍රාදේශීය සභාව සතු වී ඇති බව ප්‍රකාශයට පත් කර ඇති හෝ වෙනත් ආකාරයකින් සභාවට පැවරී ඇති හා එකී අයිතිය සනාථ කළ හැකි පාරවල් හෝ පටු මාවත් පමණක් සංවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීමට සෑම ප්‍රාදේශීය සභාවක් ම වග බලා ගත යුතු ය.

3.7.3 ප්‍රාදේශීය සභාව සතු වී ඇති කිසියම් පාරක් හෝ පටු මාවතක් සම්පූර්ණයෙන් නොව, ඉන් කොටසක් පමණක් සංවර්ධනය කරනු ලබන අවස්ථාවක දී, "අසවල් තැනැත්තාගේ ඉඩම හෝ නිවස අසල සිට අසවල් තැනැත්තාගේ ඉඩම හෝ නිවස දක්වා" යනුවෙන් ව්‍යාපෘති නාමය හැඳින්වීම නොකර එකී පාරේ හෝ පටු මාවතේ ඒ සංවර්ධනය පටන් ගන්නා ස්ථානයට සහ අවසන් කරන ස්ථානයට, ඒ පාර හෝ පටු මාවත ආරම්භ වන ස්ථානයේ සිට ඇති දුර ප්‍රමාණය (Chainage) දක්වමින් ඒ ව්‍යාපෘතියේ නාමය හැඳින්වීමට ක්‍රියා කළ යුතු ය. (පහත උදාහරණය බලන්න)




3.7.4 කිසියම් පාරක් හෝ පටු මාවතක් සංවර්ධනය කළ ව්‍යාපෘතියක් අවසන් වීමෙන් පසුව, එකී පාරට හෝ පටු මාවතට අදාළ ව පවත්වාගෙන යනු ලබන ඉලෙක්ට්‍රොනික ලිපි ගොනුවේ සහ දෘඩ ලිපි ගොනුවේ පවත්වා ගෙන යනු ලබන සැලසුමෙහි එකී සංවර්ධනය කළ කොටස පිළිබඳ ව අදාළ සලකුණු හා සටහන් ඇතුළත් කරනු ලැබූ බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක්, ඒ ව්‍යාපෘතියට අදාළ අවසන් ගෙවීම් කළ යුතු ය. යම් මුදල් ප්‍රමාණයක් අත රැඳවුම් මුදලක් ලෙස රඳවා ගෙන ඇති අවස්ථාවක, එකී මුදල නිදහස් කිරීමට පෙර මෙම සටහන් සහ සලකුණු කිරීම් සිදු කර ඇති බව තවදුරටත් තහවුරු කර ගැනීම අනිවාර්යයෙන් ම කළ යුතු ය.

**4**. මෙම චක්‍රලේඛය අනුව ක්‍රියා කිරීමේ මතු වන යම් ගැටළුවක් වේ නම්, මා විමසන ලෙස වැඩිදුරටත් දන්වමි.

අයි. එම්. අයි. ඉලංගකෝන්
පළාත් පාලන කොමසාරිස්,
වයඹ පළාත.

පිටපත්: 1. ගරු ආණ්ඩුකාරතුමා - කාරුණික දැන ගැනීම පිණිස.
2. විගණකාධිපති - දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා.
3. ප්‍රධාන ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස.
4. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම පිණිස.
5. පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් (කුරුණෑගල සහ පුත්තලම)

ඇමුණුම 01

## . . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව

## පාරවල්වල සහ පටු මාවත්වල දත්ත සමීක්ෂණ පත්‍රිකාව

01. පාරේ හෝ පටු මාවතේ නම (ඇත්නම්): . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

02. සභාවේ ඡන්ද කොට්ඨාස අංකය: . . . . . . . . . . . . . නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

03. ග්‍රාම නිලධාරි වසමේ අංකය: . . . . . . . . . . . . . . නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

04. පාරේ හෝ පටු මාවතේ ආරම්භක ඛණ්ඩාංක:

වම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . දකුණ: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

05. පාරේ හෝ පටු මාවතේ අවසාන ඛණ්ඩාංක:

වම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . දකුණ: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

06. පාරේ හෝ පටු මාවතේ අයිතිය: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

07. පාරේ හෝ පටු මාවතේ මතුපිට තලයේ ස්වභාවය:

| මතුපිට තලය | ආරම්භක ඛණ්ඩාංකය | අවසාන ඛණ්ඩාංකය | දිග (මීටර්) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

08. පාරේ හෝ පටු මාවතේ සම්පූර්ණ දුර මීටර්: . . . . . . . . . . . . . . . . . . සාමාන්‍ය පළල මීටර්: . . . . . . . . . . . . . . . .

09. පාරේ හෝ පටු මාවතේ සංවර්ධිත මතුපිට තලයේ සාමාන්‍ය පළල මීටර්: . . . . . . . . . . . . . . . .

10. පාර හෝ පටු මාවත භාවිත කරන තැනැත්තන් පදිංචි නිවාස ගණන: . . . . . . . . . . . . .

11. පාර හෝ පටු මාවත ඔස්සේ සිටුවා ඇති මුළු විදුලි කණු ගණන: . . . . . . . . . . . . . . .

12. පාරට හෝ පටු මාවතට අදාළ ව සවි කර ඇති වීථි පහන් ගණන: . . . . . . . . . . . . . . .

13. වීථි පහන් දත්ත:

| අනු අංකය | අංකය | වීථි පහන් වර්ගය | ඛණ්ඩාංක | ක්‍රියාකාරිත්වය | භාරකරුගේ විස්තර |
|---|---|---|---|---|---|
| 01. | | | | | |
| 02. | | | | | |
| 03. | | | | | |
| 04. | | | | | |
| 05. | | | | | |
| 06. | | | | | |

| අනු අංකය | අංකය | වීපී පහන් වර්ගය | බණ්ඩාංක | ක්‍රියාකාරිත්වය | භාරකරුගේ විස්තර |
|---|---|---|---|---|---|
| 07. | | | | | |
| 08. | | | | | |
| 09. | | | | | |
| 10. | | | | | |
| 11. | | | | | |
| 12. | | | | | |
| 13. | | | | | |
| 14. | | | | | |
| 15. | | | | | |

14. ඉදිකිරීම් දත්ත

| අනු අංකය | ඉදිකිරීම් අංකය | ඉදිකිරීම් වර්ගය | බණ්ඩාංක |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

සමීක්ෂණ දිනය:20 . . . . . . . . . . . .

සමීක්ෂණය කරන ලද්දේ:

| නම | තනතුර | අත්සන |
|---|---|---|
| | | |
| | | |

## ජාලගත සැලසුම් පිළියෙළ කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන දත්ත සටහන් දක්වන ඒකාබද්ධ වගු

ඇමුණුම 02

Attribute Tablefor Road Layer

| ID | R_NUMBER | R_NAME | AUTHORITY | TYPE | ST_COOR_L | ST_COOR_R | END_COOR_L | END_COOR_R | LENGTH | WIDTH | DEV_WIDTH |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

Attribute Tablefor Streetlamp Layer

| ID | R_NUMBER | STR_L_NUMBER | L_TYPE | COORDINATE | G_NAME | G_CONTACT |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

Attribute Tablefor Culvert Layer

| ID | R_NUMBER | C_NUMBER | C_TYPE | COORDINATE |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

Acronyms (කෙටි යෙදුම් විස්තරය):

| | | | | | |
|---|---|---|---|---|---|
| **ID** | Identification - හඳුනා ගැනීම | **END_COOR_L** | End Coordinate Left<br>අවසාන බණ්ඩාංක වම | **L_TYPE** | Type of Light - වීථි පහන් වර්ගය |
| **R_NUMBER** | Road Number - පාරේ අංකය | **END_COOR_R** | End Coordinate Right<br>අවසාන බණ්ඩාංක දකුණ | **G_NAME** | Guardian’s Name - භාර කරුගේ නම |
| **R_NAME** | Road Name - පාරේ නම | **DEV_WIDTH** | Developed Width - සංවර්ධිත පළල | **G_CONTACT** | Guardian’s Contact No.<br>භාර කරුගේ දුරකතන අංකය |
| **ST_COOR_L** | Start Coordinate Leftආරම්භක බණ්ඩාංක වම | **STR_L_NUMBER** | Street Light Number<br>වීථි පහන් අංකය | **C_NUMBER** | Culvert Number - බෝක්කුවේ අංකය |
| **ST_COOR_R** | Start Coordinate Right - ආරම්භක බණ්ඩාංක දකුණ | | | **C_TYPE** | Culvert Type - බෝක්කුවේ වර්ගය |

## Symbols that allocated to be used by each Pradeshiya Sabha in North-Western Province for road numbering

| # | Name of Local Authority | Symbol | # | Name of Local Authority | Symbol | # | Name of Local Authority | Symbol |
|---|---|---|---|---|---|---|---|---|
| 01. | Alawwa | ALP | 11. | Kobeigane | KOP | 21. | Pannala | PNP |
| 02. | Anamaduwa | ANP | 12. | Kuliyapitiya | KUP | 22. | Polgahawela | POP |
| 03. | Arachchikattuwa | ARP | 13. | Kurunegala | KNP | 23. | Polpithigama | PLP |
| 04. | Bingiriya | BIP | 14. | Mahawa | MAP | 24. | Puttalama | PUP |
| 05. | Chilaw | CHP | 15. | Mawathagama | MWP | 25. | Rideegama | REP |
| 06. | Galgamuwa | GAP | 16. | Narammala | NAP | 26. | Udubaddawa | UDP |
| 07. | Giribawa | GIP | 17. | Nattandiya | NTP | 27. | Wariyapola | WAP |
| 08. | Ibbagamuwa | IBP | 18. | Nawagattegama | NGP | 28. | Wanathawilluwa | WNP |
| 09. | Kalpitiya | KAP | 19. | Nikaweratiya | NIP | 29. | Wennappuwa | WEP |
| 10. | Karuwalagaswewa | KRP | 20. | Panduwasnuwara | PAP | | | |

**පාරවල්වල සහ පටු මාවත්වල සංවර්ධිත තලය, වීථි පහන් සහ පාරේ හෝ පටු මාවතේ දෙපස ඉදි කර ඇති ගොඩනැගිලි හඳුනා ගැනීම පහසු කිරීම පිණිස, ඒ පාරේ හෝ පටු මාවතේ සැලැස්මට ඇතුළත් කළ යුතු වර්ණ**

| # | Surface layer / Building | Colour | Colour Code | | |
|---|---|---|---|---|---|
| | | | Red | Green | Blue |
| 01. | Asphalt Concrete - කාපට් | | | | |
| 02. | Tar - තාර | | 174 | 170 | 170 |
| 03. | Concrete - කොන්ක්‍රීට් | | 237 | 125 | 49 |
| 04. | Interlock Bricks - අන්තර් සම්බන්ධිත ගල් | | 112 | 48 | 160 |
| 05. | Gravelle - බොරළු | | 131 | 60 | 12 |
| 06. | Building - ගොඩනැගිල්ල | | 225 | 127 | 00 |
| 07. | Streetlight - වීථි පහන - SIZE – 2 | | 248 | 228 | 2 |
| 08. | Roads in the Network Road Plan- ජාලගත පාරවල් සහ පටු මාවත් සැලැස්මේ පාරවල් | | 196 | 21 | 15 |

ඇමුණුම 05

පළමුවන සභා යෝජනාවේ ආදර්ශය

3.4.1 ඡේදය

"වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238 / 35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වා ගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ මෙහි උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මාවත් වශයෙන් සැලකිය යුතු බව . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

උපලේඛනය

*(නියෝගවල තුන් වන උපලේඛනයට සාරානුකූලව සකස් කළ පාරවල් සහ පටු මාවත්වල ලේඛනය මෙහි ඇතුළත් කරන්න)*

---

ඇමුණුම 06

පළමුවන ගැසට් නිවේදනයේ ආදර්ශය

3.4.2 ඡේදය

## පළාත් පාලන නිවේදන

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය සමග කියවිය යුතු, වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238 / 35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹපළාතේප්‍රාදේශීයසභාවිසින්පවත්වාගෙනයනුලබනපාරවල්හාපටුමාවත්වලසැලසුම්පිළියෙළකිරීමහානාමලේඛනය දක්වමින් දැන්වීම්පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙන් වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවලට පවරා දී ඇති කාර්යය අනුව, මෙහිපහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව සතු වී ඇති පාරවල් සහ පටු මාවත් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු බව 202. . . . . . . . . දින පවත්වනු ලැබූ සභා රැස්වීමේ අංක . . . . . . යටතේ තීරණය කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකීඋපලේඛනයේ ඇතුළත් යම් පාරක් හෝ පටු මාවතක් කිසියම් ඉඩමක් හරහා හෝ යම් ඉඩමක කොටසකට ඇතුළත් වන බව, ඒ ඉඩමට හිමිකම් කියනු ලබන පාර්ශවයේ මතය වේ නම්, එකී ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා මේ නිවේදනයේ දින සිට මාස තුනක කාලයක් ඉකුත් වීමට පෙර නිසි අධිකරණයේ නඩුවක් පැවරීමට ක්‍රියා කළ යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවදුරටත් එසේම, එකී මාස තුනක කාලය අවසන් වීමට පෙර එවැනි නඩුවක් පවරා නැති එකී උපලේඛනයේ ඇතුළත් සෑම පාරක් ම සහ පටු මාවතක් ම . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති පාරක් හෝ පටු මාවතක් ලෙස සලකනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

202 . . . . . . . . . . . . . දින,                                        සභාපති

. . . . . . . . . . . . . . . . . . දී ය.                                        . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව

උපලේඛනය

*(මහා සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ පාරවල් සහ පටු මාවත්වල ලේඛනය මෙහි ඇතුළත් කරන්න)*

ඇමුණුම 07

නඩු ලේඛනයේ ආදර්ශය

3.4.3 ඡේදය

නඩු ලේඛනය

**මහේස්ත්‍රාත් අධිකරණයේ / දිසා අධිකරණයේ නම: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .**

ලේඛනයෙහි වම් පස

| අනු අංකය | නඩු අංකය | පැමිණිලි කළ දිනය | පැමිණිලි කරුගේ නම | ලිපිනය | පළමුවන ගැසට් නිවේදනයේ උපලේඛනයේ යොමුව |
|---|---|---|---|---|---|
| 01. | | | | | |
| 02. | | | | | |
| 03. | | | | | |
| 04. | | | | | |
| 05. | | | | | |
| 06. | | | | | |
| 07. | | | | | |

ලේඛනයෙහි දකුණු පස

| දෙවන උපලේඛන යොමුව | නඩුව අවසන් කළ දිනය | අධිකරණ නියෝගය | නියෝගය අනුව කළ වෙනස් කම් (ඇත්නම්) | දෙවන ගැසට් නිවේදනයේ | | ලේකම්ගේ කෙටි අත්සන |
|---|---|---|---|---|---|---|
| | | | | අංකය | දිනය | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඇමුණුම 08

දෙවන සභා යෝජනාවේ ආදර්ශය

3.4.4 ඡේදය

"වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238 / 35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වා ගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ, 202 . . . . . .වන දින පවත්වනු ලැබූ . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක: . . . . . . දරන තීරණය අනුව, 202 . . . . . . දින ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් සහ පටු මාවත් අතරින් නිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් . . . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව . . . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

උපලේඛනය

*(පළමුවන ගැසට් නිවේදනයේ ඇතුළත් කරනු ලැබූ සහ මෙතෙක් නඩු පවරා නැති පාරවල් සහ පටු මාවත්වල ලේඛනය මෙහි ඇතුළත් කරන්න)*

---

ඇමුණුම 09

දෙවන ගැසට් නිවේදනයේ ආදර්ශය

3.4.5 ඡේදය

## පළාත් පාලන නිවේදන

"වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238 / 35 සහ 2021 ජූලි මස 30 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති "වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වා ගෙන යනු ලබන පාරවල් හා පටු මාවත්වල සැලසුම් පිළියෙළ කිරීම හා නාමලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග" මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ, 202 . . . . . . . . . . දින හා අංක . . . . . දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබූ නිවේදනයේ ඇතුළත් උපලේඛනයේ . . . . . . . . . . ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සලකනු ලැබූ පාරවල් සහ පටු මාවත් අතරින්, එකී නිවේදනයෙන් නියම කර ඇති දිනයට පෙර නිසි අධිකරණයක නඩුවක් පවරා නැති පාරවල් හා පටු මාවත් සහ එකී දිනයට පෙර නිසි අධිකරණයක නඩුවක් පවරා තිබී, එම අධිකරණය විසින් දෙන ලද තීන්දු ප්‍රකාර ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සලකනු ලබන බවට තහවුරු කරන ලද පාරවල් සහ පටු මාවත් සියල්ල ම . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව සතු විය යුතු බවට 202 . . . . . . . . . දින පවත්වනු ලැබූ මහා සභාවේ අංක: . . . . . . . යටතේ සම්මත කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එකී පාරවල් සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් මෙහි උපලේඛනයේ ඇතුළත් කර ඇති අතර එහි ඇතුළත් සෑම පාරක් ම සහ පටු මාවතක් ම, ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තියේ (5) උප වගන්තිය යටතේ . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව සතු කරනු ලැබ ඇති පාරවල් සහ පටු මාවත් ලෙස සලකනු ලැබිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

202 . . . . . . . . . . . . . දින, සභාපති

. . . . . . . . . . . . . . . . . . දී ය. . . . . . . . . . . . . . ප්‍රාදේශීය සභාව

උපලේඛනය

*(දෙවන සභා යෝජනාවට ඇතුළත් කරනු ලැබූ පාරවල් සහ පටු මාවත්වල ලේඛනය මෙහි ඇතුළත් කරන්න)*